# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2365/35 - 2024 ජනවාරි මස 03 වැනි බදාදා - 2024.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## හිමිකම් ලියාපදිංචි කිරීම

1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

14 වැනි වගන්තිය යටතේ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ තීරණ ප්‍රකාශය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1077 - ගම්පොලවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගම්පොලවෙල නමැති ගමේ පිහිටියා වූ ද, අංක 320740 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 7 හි කැබලි අංක 1 : 77, 1 : 78 සහ 1 : 82 දරන ඉඩම් කොටස් ලෙස පෙන්නුම් කොට ඇත්තා වූ ද, හිමිකම් පෑම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර 2023.11.06 වැනි දින අංක 2357/08 දරන *ගැසට් පත්‍රයේ* යථා පරිදි පළකරන ලද අංක 32/0920 දරන දැන්වීමේ සඳහන් කොට ඇත්තා වූ ද, ඉඩම් කොටස්වල අයිතිය සම්බන්ධයෙන් මෙහි උපලේඛනයේ දැක්වෙන මාගේ තීරණ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වැනි වගන්තියෙන් පහත අත්සන් කරන මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මම මෙයින් ප්‍රකාශ කරමි.

**පී.සී.ඩී.සිගේරා,**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 18 වැනි දින,
බත්තරමුල්ල,
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.



*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය

| පත්‍ර අංකය සහ කොටසේ අංකය | ඉඩම් විශාලත්වය (හෙක්ටයාර්) | අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම/නම් සහ ලිපිනය | ජාතික හැඳුනුම්පත් අංකය | අයිති ඉඩමේ ප්‍රමාණය | අයිතියේ පන්තිය සහ ස්වභාවය | විනිශ්චයන් සහ ඉන්ජෙන්ෂන් තහනම් අපේක්ෂාවෙන් ඇති උකස් සහ බැඳීම් පිළිබඳ විස්තර | යම් විශේෂ හෝ පෞද්ගලික නීතියකට යටත් නම් ඒ පිළිබඳ විස්තර |
|---|---|---|---|---|---|---|---|
| 1:77 | 0.1463 | ගහ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය සභාව , ගහ ඉහළ කෝරළේ | | සම්පූර්ණ | ප්‍රථම පන්තිය | _ | _ |
| 1:78 | 0.0949 | ගහ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය සභාව , ගහ ඉහළ කෝරළේ | | සම්පූර්ණ | ප්‍රථම පන්තිය | _ | _ |
| 1:82 | 0.0902 | ගහ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය සභාව,ගහ ඉහළ කෝරළේ | | සම්පූර්ණ | ප්‍රථම පන්තිය | _ | _ |

EOG 12-0418

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.